මූලස්ථානය
ජාතික ශිෂ්‍යභට බලකාය
අංක 15, දුටුගැමුණු වීදිය
ජාශිබ/ප්‍ර/6(149) පාමංකඩ - දෙහිවල

බෙදාහැරීම බලන්න 2018 ජනවාරි මස 03 දින

**පාලන නියෝග**

**කොනොනි පුහුණු කඳවුර - 2018 - අදියර - II**

1. **අරමුණ** :- 2018 වර්ෂයේ ඇගයීම් කඳවුරු සඳහා සහභාගී වීමට නියමිත බාලක/බාලිකා යුධ, නාවික, ගුවන්, පොලිස් ශිෂ්‍යභට බණ්ඩයන්හි ශිෂ්‍යභට සැරයන්වරුන් හට න්‍යායික හා ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම.

2. **කාලසීමාව** :- 2018.01.15 සිට 2018.01.23 දින දක්වා

3. **සහභාගීත්වය** :-

I. 21 ජාශිබ සිට 38 ජාශිබ දක්වා 2018 වර්ෂයේ ඇගයීම් කඳවුරු සඳහා සහභාගී වීමට නියමිත බාලක/බාලිකා යුධ, නාවික, ගුවන්, පොලිස් ශිෂ්‍යභට බණ්ඩයන්හි ශිෂ්‍යභට සැරයන් වීමට යෝජිත කොනොනිවරයන්/කොනොනිවරියන් මේ සඳහා සහභාගී කරවීම අත්‍යවශ්‍ය වේ.

II. එක් බලඇණියකින් සහභාගී කරවිය හැකි උපරිම සංඛ්‍යාව 50කි මෙම සංඛ්‍යාව ඉක්මවා නොයන පරිදි ශිෂ්‍යභට බාලකයන්/බාලිකාවන් සහභාගී කරවීමට අණදෙන නිලධාරී/නිලධාරිනීන් වගබලා ගත යුතු වේ.

III. රාජකාරී සඳහා පත්කල සියළුම නිලධාරීන්/නිලධාරිනීන් හා සියළුම බලඇණි පුහුණුවීම් භාර නිලධාරීන්/ නිලධාරිනීන් සහභාගී වීම අත්‍යාවශ්‍ය වේ.

IV. රාජකාරී සඳහා නම් කරන ලද සියළුම නිකාම උපදේශකවරුන් හා ශිෂ්‍යභට ජ්‍යේකොනොනින්

V. 23 ජාශිබ විසින් අපරදිග තූර්යවාදන බණ්ඩයක් නම් කල යුතුය.

4. ස්ථානය :- ජාතික ශිෂ්‍යභට බලකා පුහුණු මධ්‍යස්ථානය රන්ටැඹේ
දුරකථන :- 055-2258840 / 055-2258841 / 055-2258846
ඊ මේල් :- nccrtb@gmail.com

5. **(අ) කඳවුරු සඳහා පත්කිරීම්**

| | | |
|---|---|---|
| කඳවුරු භාර නිලධාරී | :- | සේනාවිධායක - පුම රන්ටැඹේ |
| එම සහාය අණදෙන නිලධාරී | :- | ලුතිතන් කර්නල් එල්ජී කසුන් කිත්සිරි - 01 ජාශිබ |
| එම සහාය අණදෙන නිලධාරිනී | :- | ලුතිතන් කර්නල් එස්අයිපී ද සොයිසා - 27 ජාශිබ |
| පුහුණුවීම් භාර නිලධාරී | :- | මේජර් ජේසී බමුණුසිංහ ආරච්චි |
| මුදල් හා පාලන කටයුතු භාර නිලධාරිනී | :- | ලුතිතන් කර්නල් එස්ඒඑන්ඩී සියඹලාපිටිය |
| භකාස කටයුතු භාර නිලධාරී | :- | මේජර් ජේඒ සෝමරත්න |

**(ආ) නිකාම උපදේශක (යුධ)** :- 21 - 38 දක්වා බලඇණි වෙතින් එක් යුධ හමුදා උපදේශයකු බැගින්

**(ආ) නිකාම උපදේශක (නාවික)** :-

| | | |
|---|---|---|
| ප්‍රසුනි | එන්ජ් සෙනෙවිරත්න | - 25 ජාශිබ |
| ප්‍රසුනි | බීඑම්එස්ජේ කුමාර | - 32 ජාශිබ |
| සුනි | ඒ ප්‍රේමරත්න | - 22 ජාශිබ |
| සුනි | ඩීඑම්එස් දිසානායක | - 28 ජාශිබ |
| සුනි | ජීඩී කුමාර | - 29 ජාශිබ |

| | | | |
|---|---|---|---|
| **(ආ) නිකාම උපදේශක (ගුවන්)** | :- | කෝප්‍රල් දලුවත්ත පේඑස් | - 33 ජාශිබ |
| | | කෝප්‍රල් විජේරත්න බීඒඑල් | - 25 ජාශිබ |
| | | කෝප්‍රල් පීරිස් පිපිඑස් | - 31 ජාශිබ |
| | | සැරයන් ප්‍රේමසිංහ | - 22 ජාශිබ |
| | | සැරයන් බාලසූරිය බීපීඑස් | - 35 ජාශිබ |
| **(ආ) නිකාම උපදේශක (පොලිස්)** | :- | පො.සැ හේරත් | - 05 ජාශිබ |
| | | පො.සැ රත්නායක | - 14 ජාශිබ |
| | | කා.පො.සැ. ගමගේ | - 32 ජාශිබ |
| | | කා.පො.සැ. නිර්මලා | - 32 ජාශිබ |
| | | කා.පො.කො ශ්‍රියාකුමාරි | - 32 ජාශිබ |
| **(ඇ) ශිෂ්‍යභට ජේකොනොනි** | :- | රෙ.සැ.මෙ<br>22 ජාශිබ හා 25 ජාශිබ වෙතින් නම් කල යුතුය.<br>රෙ.උ.පා.සැ.මෙ<br>23 ජාශිබ හා 29 ජාශිබ වෙතින් නම් කල යුතුය. | |
| කණ්ඩායම් භාර සැරයන් මේජර් | :- | 23,24,25,26,29,30,38 බලඇණි වෙතින් නම් කල යුතුය. | |
| මාණ්ඩලික සැරයන් | :- | 31,32,33,34,35,36,37,38 බලඇණි වෙතින් නම් කල යුතුය. | |

**6. ප්‍රවාහනය**

I. ප්‍රධාන ගමන් කොටස 2018.01.15 දින සිදුකෙරේ. සියලුම නිලයන් මුල ජාශිබ මගින් ලබා දෙන ප්‍රවාහන පිළිවෙතට අනුව ගමන් කල යුතු අතර, බලඇණි පුහුණුවීම් භාර නිලධාරීන්/නිලධාරිණීන් ගමන් භාර නිලධාරීන් ලෙස ක්‍රියා කල යුතුය. පුහුණුවීම් භාර නිලධාරීන්/නිලධාරිණීන් නොමැති බලඇණිවල ගමනාධිපත්වරුන් ලෙස බලඇණි විධායක අධිකාරිවරුන් ක්‍රියාකල යුතුය.

II. තූර්ය වාදන ඛණ්ඩය 2018.01.15 වන දින 0200 පැයට ප්‍රථම කඳවුරට වාර්තා කල යුතුය.

**7. ආහාර**

2018.01.15 දින රාත්‍රියේ සිට ආහාර සපයනු ලැබේ. සක්‍රිය සේවා නිලධාරීන්ට හා නිකාම උපදේශකයින් සඳහා ශ්‍රීලයුසේභ පිළිවෙතට අනුව ආහාර සපයනු ලැබේ.

**8. ඛණ්ඩභාර නිලධාරීන්**

සියලුම බලඇණි පුහුණුවීම් භාර නිලධාරීන් ඒ ඒ බලඇණි ඛණ්ඩභාර නිලධාරීන් ලෙස රාජකාර ඉටුකල යුතු වේ. පුහුණුවීම් භාර නිලධාරී නොමැති බලඇණි සඳහා ඛණ්ඩභාර නිලධාරියෙකු නම් කර එවීමට අණදෙන නිලධාරී ක්‍රියාකල යුතු වේ.

**9. ඇඳුම**

නිලධාරීන් - කරපටි සහිත සිවිල් ඇඳුම
ශිෂ්‍යභට බාලක - පාසල් නිල ඇඳුම කරපටි සහිත
ශිෂ්‍යභට බාලිකා - පාසල් නිල ඇඳුම කරපටි සහිත
උපදේශකයින් - සිවිල් ඇඳුම

**10. කඳවුරට රැගෙන ආ යුතු දේ**

**නිලධාරී/ නිලධාරිණීන්**

ශාරීරික අභ්‍යාස ඇඳුම, අංක 06 නිල ඇඳුම, අංක 04 නිල ඇඳුම, අසිපත් බහාලනය, සැම් බ්‍රවුන්, බ්ලේසරය හා දින 09කට අවශ්‍ය පුද්ගලික බඩුභාහිරාදිය.

**ශිෂ්‍යභට බාලක**

සුදු කොට කලිසම, සුදු කැන්වස්, සුදු මේස්, සුදු පැහැති අත්කොට කොලරය සහිත ටී ෂර්ට්, පාසල් නිල ඇඳුම, පෞද්ගලික ඇඳුම්, රබර් සෙරෙප්පු, ක්‍රීඩා ඇඳුම, කළු බූට් ලේස් හා, කළු බූට් පොලිෂ්, පිඟාන, හැන්ද,ගැරුප්පුව, කෝප්පය, ඉඳිකටු, බොත්තම් සහ නූල් (සුදු හා කළු), අයිලට්, පෑන්, සටහන් ලිවීම සඳහා CR පොතක්, අඩිරූලක්, සුදු කොට්ට උර, විදුලි පන්දමක්, ඉබි යතුරු දැමිය හැකි සූට්කේස් එකක් ඇතුළු දින 09කට අවශ්‍ය පුද්ගලික බඩුභාහිරාදිය.

**ශිෂ්‍යභට බාලිකා**

ඩිවයිඩඩ් ස්කර්ට්ස්, සුදු කැන්වස්, සුදු මේස්, සුදු පැහැති අත්කොට කොලරය සහිත ටී ෂර්ට්, පාසල් නිල ඇඳුම, පෞද්ගලික ඇඳුම්, රබර් සෙරෙප්පු, ක්‍රීඩා ඇඳුම, කළු බූට් ලේස් හා, කළු බූට් පොලිෂ්, පිඟාන, හැන්ද, ගැරුප්පුව, කෝප්පය, ඉඳිකටු, බොත්තම් සහ නූල්, අයිලට්, පෑන්, පැන්සල්, සටහන් ලිවීම සඳහා CR පොතක්, සුදු කොට්ට උර, ඉබි යතුරු දැමිය හැකි සූට්කේස් එකක් ඇතුළු දින 09කට අවශ්‍ය පෞද්ගලික බඩු බාහිරාදිය.

**11. උප්පැන්න හැඳුනුම්පත්**

හැඳුනුම්පත් හා උප්පැන්න සහතිකය රැගෙන ඒම අනිවාර්ය වේ. උප්පැන්න සහතිකයේ මුල් පිටපත නොමැති නම් රෙජිස්ටාර්වරයෙකු විසින් සහතික කරන ලද ජායා පිටපතක් රැගෙන ආ යුතු අතර, හැඳුනුම්පත් නොමැති අය අණදෙන නිලධාරී විසින් සහතික කරන ලද ජායාරූපයක් රැගෙන ආ යුතුය.

**12. ඌනතා හා අලාභ හානි**

තම බලඇණියට අයත් සියලුම නිලඇඳුම් උපකරණ හා බැරක්ක භාණ්ඩ පුහුණුවීම් භාර නිලධාරීන් විසින් ලබාගත යුතු අතර ඒවා ඌනතාවයන් රහිතව නැවත භාරදීම ඔවුන්ගේ වගකීම වේ.

**13. නාම ලේඛන**

කඳවුරට සහභාගී වන සියලුම කොනොනිවරුන් 2018.01.01 දිනට වයස අවුරුදු 14ට වැඩි අයවලුන් බවත් 2018.12.31 දිනට අවුරුදු 20ට අඩු අයවලුන් බවත් 1994/1 චක්‍රලේඛණයට අනුකූල බවත් විදුහල්පති විසින් සහතික කරන ලද ලිපියක් බලඇණි මූලස්ථානයට ලබා දිය යුතු අතර බලඇණි මූලස්ථානය වෙතින් පහත ආකෘති පත්‍රය අනුව සකසන ලද නාම ලේඛන පිටපත් 08ක් බලඇණි පුහුණුවීම් භාර නිලධාරී/ නිලධාරිණීන් විධායක අධිකාරීවරුන් කඳවුරට පැමිණි විගස භාරදිය යුතුයි.

**කොනොනි පුහුණු කඳවුර - 2018 අදියර II**

**බලඇණිය - .........................**

| අ.අ | රෙජි.අංකය | නිලය | නම | විද්‍යාලය | උපන් දිනය | හැඳුනුම්පත් අංකය | උපදේශක සහතික අත්සන | ශිෂ්‍යභට අත්සන | වෛද්‍ය පරීක්ෂණයට සහභාගී වී ඇත/නැත |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | | | |
| 2 | | | | | | | | | |
| 3 | | | | | | | | | |
| 4 | | | | | | | | | |

ඉහත නම් සඳහන් ශිෂ්‍යභට කොනොනින් 2018.01.01 දිනට වයස අවුරුදු 14ට වැඩි බවත් 2018.12.31 දිනට අවුරුදු 20ට අඩු බවත් ඔවුන් 1994/1 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛනයට අනුකූල බවත් සහතික කරමි.

.............................................. ..............................................

අණදෙන නිලධාරී අත්සන විධායක අධිකාරී අත්සන

(නිල මුද්‍රාව තබා)

14. 2017 කුමන හෝ ඇගයීම් කඳවුරකට වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් නොකල ශිෂ්‍යභටයෙක්/භටවියක් රජයේ වෛද්‍ය නිලධාරියෙක් වෙතින් ඒ සඳහා අධ්‍යක්ෂ ජාශිබ විසින් නිකුත් කර ඇති ලිපිය පරිදි වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

**15.** පොදු I, ප්ලාස්ටික් බෝතල්, ෂොපින් බෑග්, ජංගම දුරකතන, කැමරා, වටිනා රන් දම්වැල් හා රන් ආභරණ ගෙන ඒමෙන් වැලකිය යුතුය. ඒවා නැතිවීම සඳහා පුහුණු මධ්‍යස්ථානය වගකිම් දරනු නොලැබේ.

I. බෝවන රෝග වලින් හෝ නිදන්ගත ආබාධ වලින් පෙලෙන අයවලුන් කඳවුර සඳහා සහභාගි නොකර වීමට අණදෙන නිලධාරී වරයා වගබලා ගත යුතුය.

II. සියලු ශිෂ්‍යභටයින් කොන්ඩය කොටට කපා සිටිය යුතුය.

III. කඳවුරට සහභාගි වන කිසිම නිලයකට කඳවුරු කාලය තුල නිවාඩු, කෙටි නිවාඩු අනුමත නොකෙරේ. අත්‍යාවශ්‍ය හේතුවකට කඳවුරු කාලය තුල කෙටි නිවාඩු අවශ්‍ය ශිෂ්‍යභටයින් කඳවුරු ගත වීම ආරම්භ වන දිනයේදීම විදුහල්පති/ අණදෙන නිලධාරී ඒ සඳහා නිර්දේශ කර ඇති ලිපියක් සේනාවිධායක වෙත භාර දිය යුතුය.

**16.** කඳවුරට පැමිණීමේදීත් කඳවුර තුලදීත් ආපසු ගමනේදීත් සියලු නිලයන් ඉතා උසස් විනයෙන් කටයුතු කල යුතුය.

**එන්කේ වක්කුඹුර**
කර්නල්
බ්‍රිගේඩියර් පුහුණු
ජාතික ශිෂ්‍යභට බලකාය

<u>බෙදාහැරීම</u> :-
පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂ, සියලු පළාත් මූලස්ථාන
සේනාවිධායක, පුහුණු මධ්‍යස්ථානය - රන්ටැඹේ
අණදෙන නිලධාරී 21 - 38 බලඇණි - අදාල සියලුම ශිෂ්‍යභට බණ්ඩ දැනුවත් කිරීම සඳහා
<u>අභ්‍යන්තරික</u> :-
පාලන හා භකාස අංශය - අවශ්‍ය පහසුකම් සැපයීම
බලකා ලේකම් අංශය
නාවික හමුදා සම්බන්ධීකරණ නිලධාරී
ගුවන් හමුදා සම්බන්ධීකරණ නිලධාරී
පොලිස් සම්බන්ධීකරණ නිලධාරී
ප්‍රවාහනභාර නිලධාරී